PN/VAT/2024-01
26.03.2024

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## බදු ගෙවන්නන් වෙත කෙරෙන නිවේදනයයි

## 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම

2024 අංක 16 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත 2024 මාර්තු මස 20 වන දින සහතික කර ඇති අතර එම සංශෝධනය අනුව 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට වන සැළකිය යුතු වෙනස්කම් පහත පරිදි වේ.

**1. සම්මත එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය සංශෝධනය කිරීම**

2023 දෙසැම්බර් 19 දිනැති අංක 2363/22 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් පළ කරන ලද පරිදි භාණ්ඩ ආනයනය හා/හෝ බදු අයකළ හැකි භාණ්ඩ සැපයීම මත හෝ බදු අයකළ හැකි සේවා සැපයීම මත වන එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය 2024 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට පහළොවේ (15%) සිට සියයට දහඅට (18%) දක්වා සංශෝධනය කර ඇත.

තවද, මූල්‍ය සේවා සැපයීමට අදාළ වන එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය වූ සියයට දහඅට (18%) නොවෙනස්ව පවතිනු ඇත.

**2. ලියාපදිංචි විය යුතු සීමාව**

බදු අයකළ හැකි සැපයුම් වටිනාකම බදු අයකළ හැකි කාලසීමාව වන, එක් මාසයකට/කාර්තුවකට රුපියල් මිලියන 15 ඉක්මවන හෝ වර්ෂයකට රුපියල් මිලියන 60 ඉක්මවන තැනැත්තකු 2024 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු සඳහා ලියපදිංචි විය යුතුය. ඒ අනුව, මෙතෙක් ලියාපදිංචි වී නොමැති තැනැත්තන් මෙම සංශෝධන පනත ක්‍රියාත්මක වන 2024 මර්තු 20 වන දින සිට ලියාපදිංචි විය යුතුය.

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

බදු - වඩා හොඳ අනාගතයකට